සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සහ සමාජ ආරක්ෂණ ව්‍යාපෘතියේ කාර්යාල පහසුකම් සඳහා ගොඩනැගිල්ලක් බදු පදනම මත ලබා ගැනීම සඳහා ලංසු කැඳවීම

ප්‍රසම්පාදන අධිකාරියේ නම : මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ව්‍යාපෘතියේ නම : සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය, සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය.

ණය අංකය : 7363 - LK

ප්‍රසම්පාදන යොමු අංකය : SPP/Proc/2026-03

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ජාත්‍යන්තර සංවර්ධන සංගමය වෙතින් සමාජ ආරක්ෂණ ව්‍යාපෘතියෙහි පරිවැය අරභයා ණය මුදලක් ලැබී ඇති අතර, එම ණය ලැබීම් වලින් කොටසක් සහ ශ්‍රී ලංකා රජයේ අරමුදල් වලින් සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සහ සමාජ ආරක්ෂණ ව්‍යාපෘතියේ කාර්යාල පහසුකම් සඳහා ගොඩනැගිල්ලක් බදු පදනම මත ලබා ගැනීමේ කොන්ත්‍රාත්තුව – යොමු අංකය : SPP/Proc/2026-03 යටතේ වන ගෙවීම් සඳහා යෙදවීමට අපේක්ෂා කෙරේ.

02. සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය, සමාජ ආරක්ෂක ව්‍යාපෘතිය වෙනුවෙන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ (PPC) සභාපති විසින්, සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සහ සමාජ ආරක්ෂණ ව්‍යාපෘතියේ කාර්යාල පහසුකම් සඳහා ගොඩනැගිල්ලක් බදු පදනම මත ලබා ගැනීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුදු, තැබූ ලංසු කැඳවනු ලැබේ. ගොඩනැගිලි අවශ්‍යතාවය පහත පරිදි වේ.

ස්ථානය : කොළඹ 01 සිට 12 දක්වා සහ ඉන්නරමුල්ල උතුර සහ බටහිර

වර්ග අඩි : වර්ග අඩි 9100ත් 9200ත් අතර

කාලය : වසර තුනක (03)

03. විවෘත තරඟකාරී ලංසුකැඳවීම මගින් මෙම ප්‍රසම්පාදනය සිදුකෙරේ..

04. මේ පිළිබඳ උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු, සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ, සමාජ ආරක්ෂණ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන විශේෂඥ වෙතින් දුරකථන අංක 077-3914120 ඇමතීමෙන් ලබාගත හැකි අතර, 2026.03.23 දින දක්වා 9.00 පැය සිට 16.00 පැය දක්වා කාලයේදී පහත සඳහන් ලිපිනයේදී ලංසු ලිපිලේඛන පරීක්ෂා කොට බැලිය හැක.

5. සුදුසුකම් අවශ්‍යතාවන්ට පහත කරුණු ඇතුළත් වේ.

i. ලංසුකරු, යෝජිත පරිශ්‍රයෙහි තෙතික හිමිකරු හෝ තෙතික හිමිකරුගේ බලයලත් නියෝජිතයෙක් විය යුතුය. බලයලත් නියෝජිතයකු වන අවස්ථාවකදී ඇටර්නි බල පත්‍රය හෝ හිමිකරුගේ ලිඛිත බලයපැවරීම ඉදිරිපත් කළ යුතුය.

ii. අදාළ දේපළ, බදු ගිවිසුමට බලපෑම් කළ හැකි ඕනෑම ආකාරයක බාධක, ආරවුල් හෝ නීතීමය හිමිකම් පැමකින් තොර විය යුතුය.

iii. ලංසුකරු කිසිදු රාජ්‍ය ආයතනයක් හෝ අරමුදල් සපයන ආයතනයක් මගින් ආසාධු ලේඛන ගතකළ හෝ තහනමට ලක්කළ අයෙකු නොවිය යුතුය.

iv. පරිශ්‍රය බදු දීමේ ක්‍රියාවලියට සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි කිසිදු ආකාරයක තෙතික ක්‍රියාමාර්ගයකට ලංසුකරු සම්බන්ධ වී නොසිටිය යුතුය.

v. බදු කාලය පුරාම පරිශ්‍රය හොඳ තත්වයෙන් තබාත්තු කිරීම සඳහා වන මූල්‍ය හැකියාව ලංසුකරු විසින් විදහා දක්විය යුතුය. එය සනාථ කිරීම සඳහා පසුගිය වසර තුනක (03) බැංකු ප්‍රකාශන, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන හෝ වෙනත් මූල්‍ය ලිපි ලේඛන ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

vi. යෝජිත පරිශ්‍රය අදාළ සියලුම පළාත් පාලන ආයතන රෙගුලාසි, ගොඩනැගිලි ආඥ, ගිනි ආරක්ෂණ රෙගුලාසි සහ පරිසරික අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. වලංගු අනුකූලතා සහතික, ගොඩනැගිලි අනුමත කිරීම්, ගිනි ආරක්ෂණ නිර්කාශන සහ අනෙකුත් ව්‍යවස්ථාපිත අනුමත කිරීම් ඉදිරිපත් කළ යුතුය.

vii. ලංසු ලිපි ලේඛනයෙහි සඳහන් කර ඇති කාල සීමාව තුළ යෝජිත ගොඩනැගිල්ල භාවිත කිරීම සඳහා ලබාදීමට හැකි විය යුතුය.

viii. ලංසු ලිපි ලේඛනයෙහි දක්වා ඇති කියමනක් සහ කොන්දේසි යටතේ වසර තුනක (03) කාලයක් සඳහා බදු ගිවිසුමකට එළඹීමට ලංසුකරු එකඟ විය යුතුය.

ix. බදු කාලසීමාව පුරා ව්‍යුහාත්මක සංරචක සහ ප්‍රධාන ස්ථාපනයන් ඇතුළුව පරිශ්‍රය තබාත්තු කිරීමට ලංසුකරු එකඟ විය යුතුය.

අතිරේක තොරතුරු ලංසු ලිපි ලේඛනයෙහි දක්වා ඇත.

06. නැවත නොගෙවන ගාස්තුව ශ්‍රී ලංකා රුපියල් දස දහසක් (ශ්‍රී ලංරු. 10,000.00) ගෙවීමෙන් සහ පහත ලිපිනය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අභිලාෂ ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සැකසී ඇති ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැක. සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය වෙත මුදල් තැන්පත් කිරීම මගින් ගෙවීම් කළ යුතුය.

07. ලංසු 2026.03.24 දින 14.00 පැයට හෝ ඊට පෙර පහත ලිපිනය වෙත ගෙනවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. 2026.03.24 දින 14.00 පැයට පහත සඳහන් ලිපිනයේදී එම අවස්ථාවට ප්‍රේක්ෂකයින් පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් ලංසු විවෘත කරනු ලැබේ. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා රුපියල් ලක්ෂ පහක (ශ්‍රී ලං රු.500,000.00) වටිනා "ලංසු සුරක්ෂණයක්" අමුණා එවිය යුතුය.

08. ඉහත යොමුකරන ලද ලිපිනය (ලිපින) වන්නේ

සභාපති,
ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව,
සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය,
සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය,
ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය,
අංක 191, ධර්මපාල මාවත, කොළඹ 07.
ඊමේල් : ajanthagalhena5@gmail.com
දුරකථන අංකය : 077- 3914120